# බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## වර්ෂ අවසාන ඇගයීම - 2017

**6 ශ්‍රේණිය**

## ගණිතය

කාලය පැය 02යි.

## I - කොටස


❖ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
❖ සෑම ප්‍රශ්නයකටම ලකුණු 02 බැගින් හිමි වේ.

(01) පහත සංඛ්‍යාව වචනයෙන් ලියන්න.
2 001 540

(02) සුළු කරන්න. 652 × 36

(03) පහත දැක්වෙන සංඛ්‍යා අවරෝහණ පිළිවෙලට ලියන්න.
-3, 5, 0, -1, 3

(04) රූප සටහනේ a, b යොදා අංක කර ඇති කෝණ වර්ගවල නම් ලියන්න.
a = ..................................
b = ..................................





(05) රූපයේ දත්ත අනුව
(i) F හි සිට බලන විට B ලෙස පිහිටා ඇත්තේ කුමන දිශාවෙන් ද? ..................
(ii) E ට තිරස්ව පිහිටි අක්ෂරය කුමක් ද? ..................

| | | | | |
|---|---|---|---|---|
| A | | D | | G |
| | | | | |
| B | | E | | H |
| | | | | |
| C | | F | | I |

(06) (a) $\frac{4}{6}$ ට තුල්‍ය භාගයක් ලියන්න.
(b) විශාලම භාගය තෝරා යටින් ඉරක් අඳින්න. $\frac{1}{7}, \frac{1}{3}, \frac{1}{4}$

(07) පහත සඳහන් භාගවලට පොදු වූ ලක්ෂණ අනුව කාණ්ඩ දෙකකට වෙන් කර එක් එක් කාණ්ඩයට අයත් භාග කොටුව තුළ ලියන්න. එම එක් එක් කාණ්ඩයට සුදුසු නම තිත් ඉර මත ලියන්න.




..................................

..................................


(08) අගය සොයන්න. 1.7 + 0.3

(09) (i) 63 සංඛ්‍යාවේ එකස්ථානය හා දහයස්ථානය මාරුකර ලියූ විට ලැබෙන සංඛ්‍යාව ලියන්න.
(ii) ඔබට ලැබුණේ කිවන සමචතුරස්‍ර සංඛ්‍යාව ද?

(10) 27 හි සාධක සියල්ලම ලියන්න.

(11) එක් එක් අක්ෂරයට අනුව ගැළපෙන හැඩතලයේ නමට යා කරන්න.

| අක්ෂරය | නම |
|---|---|
| A | ත්‍රිකෝණය |
| B | ත්‍රපීසියම |
| C | සමචතුරස්‍රය |
| | සෘජුකෝණාස්‍රය |
| | සමාන්තරාස්‍රය |





(12) පහත එක් එක් ද්‍රව්‍යවල මිනුම් ලබාගැනීමට සුදුසු ම ඒකකය ලියන්න.

(i) රු. 10 කාසියක ඝනකම - ..............................

(ii) බස් රථයක දිග - ..............................


(13) විශාල භාජනයේ ජලය 1.5$l$ ක් ඇත. එයින් 230$ml$ වන කුඩා භාජනය සම්පූර්ණයෙන් පිරවූ විට විශාල භාජනයේ ඉතිරි වන ජල ප්‍රමාණය කොපමණ ද?




(14) සවිධි ඝන වස්තුවක් සෑදීමට භාවිතා කරනු ලැබූ ආකෘතියක් රූපයේ දැක්වේ.

(i) මෙයින් සෑදිය හැකි ඝනවස්තුවේ නම ලියන්න.

(ii) සාදන ලද ඝන වස්තුවේ දාරයක දිග කොපමණ ද?




(15) සංඛ්‍යාවක අටෙහි ගුණාකාරයක් ආසන්න 10ට වටයූ විට 70 බව ළමයෙක් පවසයි. එම අටෙහි ගුණාකාරය කිය ද?

(16) පස්වරු 2යි මිනිත්තු 6යි තත්පර 25 වේලාව අන්තර්ජාතික සම්මත ආකාරයට ලියා දක්වන්න.

(17) (i) 𝍸 𝍸 // ප්‍රගණන ලකුණුවලින් දක්වා ඇති සංඛ්‍යාව ලියා දක්වන්න.
(ii) 8 සංඛ්‍යාව ප්‍රගණන ලකුණුවලින් ලියා දක්වන්න.

(18) 16 : 4 අනුපාතය සරල ම ආකාරයෙන් ලියන්න.

(19) $2^3 \square 3^2$ හිස්කොටුවට ">" "<" හෝ "=" සුදුසු සංකේත තෝරා ලියන්න.

(20) සමචතුරස්‍රයක වර්ගඵලය $16cm^2$ වේ. එහි වර්ගඵලයට සමාන සෘජුකෝණාස්‍රයක පළල 2cm නම් එහි දිග සොයන්න.

## II - කොටස

❖ පළමු ප්‍රශ්නයටත් තවත් ප්‍රශ්න හතරකටත් පිළිතුරු සපයන්න.
❖ පළමු ප්‍රශ්නයට ලකුණු 16ක් ද ඉතිරි ප්‍රශ්නවලට ලකුණු 11 බැගින් ද ලැබේ.

(01) (a) ඔබ පන්තියේ ඉගෙනගත් ස්කන්ධය පිළිබඳ පාඩම සිහිපත් කරන්න.
මෙහි දී ළමයෙක් ඝන. ද්‍රව, වායු යන සියල්ලට ම ස්කන්ධයක් ඇති බව පවසයි.”

(i) මෙම ප්‍රකාශය සත්‍ය ද අසත්‍ය ද?

(ii) පහත ස්කන්ධ මැනීමට වඩාත් සුදුසු ඒකකය ලියන්න.
(අ) සහල් පුරවන ලද ගෝනියක ස්කන්ධය
(ආ) අල්පෙනෙති 50ක ස්කන්ධය

(ii) පහත වගුව පිළිතුරු පත්‍රයේ පිටපත් කරගෙන හිස්තැන් පුරවන්න.

| ආහාර ද්‍රව්‍ය | සතියකට අවශ්‍ය ප්‍රමාණය | kg එකක මිල රු. | සතියක වියදම රු. |
|---|---|---|---|
| සහල් | 11kg | 82.00 | ............ |
| හාල්මැස්සන් | ............ | 420.00 | 105.00 |
| පරිප්පු | 500g | ............ | 90.00 |
| සීනි | ............ | 100.00 | 175.00 |
| එකතුව | ............ | | ............ |

(iv) ඉහත වගුවේ සඳහන් භාණ්ඩවල මුළු ස්කන්ධය කොපමණ ද?


(v) ඉහත වගුවට අනුව සතියකට වැයවන මුළු මුදල කොපමණද?

(b) (i) අගය සොයන්න.

| $l$ | $ml$ |
|---|---|
| 5 | 650 |
| 3 | 725 + |

(ii) බීම බෝතලයක බීම 21 500$ml$ ක් ඇත. එයින් ළමයෙක් 150$ml$ ක් බීමට ගත්තේ ය. බෝතලයේ ඉතිරි බීම ප්‍රමාණය කොපමණ ද?

(02) (a) (i) රූපයේ දත්ත අනුව දී ඇති සෘජුකෝණාස්‍රයේ පරිමිතිය කොපමණ ද?




(ii) මෙම සෘජුකෝණාස්‍රය තුළ ඇඳිය හැකි විශාල ම සමචතුරස්‍රයේ පැත්තක දිග කොපමණ ද?

(iii) ABCD සෘජුකෝණාස්‍රයේ වර්ගඵලය ඉහත (ii) කොටසෙහි ඇඳි සමචතුරස්‍රයේ වර්ගඵලය මෙන් කී ගුණයක් ද?

(b) වෘත්තයක් ඇඳ වෘත්තය මත A ලක්ෂ්‍ය ද, වෘත්තයේ පිටත B ලක්ෂ්‍යය ද වෘත්තය ඇතුළත C ලක්ෂ්‍යය ද ලකුණු කරන්න.

(03) (a) (i) $2^2 \times 3^2$ විහිදුවා ලියා අගය සොයන්න.

(ii) හිස්තැන් පුරවන්න.

$$64 = 2^{\square} = 4^{\square} = \square^2$$

(b) (i) පන්තියක මුළු ළමුන් ගණන 45 කි. එක් දිනක ළමුන් p ප්‍රමාණයක් නොපැමිණියේ ය. එදින පන්තියේ සිටි ළමුන් ගණන සඳහා වීජීය ප්‍රකාශනයක් ලියන්න.

(ii) p = 6 නම් එදින පන්තියට පැමිණි ළමුන් ගණන සොයන්න.

(04) ළමුන් තුන්දෙනෙකුගේ උස මැනීමේ දි පහත අගයන් ලැබිණි.

බණ්ඩාර - 112cm මුරලි - 1m 28cm මොහොමඩ් - 1.02cm

(i) ළමුන් තිදෙනාගේ උසවල් එකම ඒකකයකින් ලියන්න.
(ii) උසින් වැඩිම ළමයා කවු ද? හේතුව ලියන්න.
(iii) 108m 96cm + 4m 84cm අගය සොයන්න.
(iv) සුළු කරන්න.

$$\begin{array}{r} 82.68 \\ \underline{5.49\ -} \\ \hline\hline \end{array}$$

(v) පහත සංඛ්‍යා අතුරින් විශාල ම සංඛ්‍යාව තෝරා ලියන්න.
2.091 , 1.928, 0.999

(05) (a) පියල් Aහි සිට 30mක් බටහිර දිශාවට ගමන් කර එතැන් සිට 10mක් උතුරු දිශාවට ගමන් කරයි. එතැන් සිට 30mක් නැගෙනහිර දිශාවට ගමන් කර B ස්ථානයට ළඟා වෙයි.
(i) ඉහත තොරතුරු දළ රූප සටහනකින් දක්වන්න.
(ii) පියල් අවසානයේ සිට B ස්ථානයේ සිට මල් පිහිටි A ස්ථානය කුමන දිශාවකින් පිහිටා ඇත් ද?
(iii) පියල් සිටි ආරම්භක ස්ථානයත් අවසාන ස්ථානයත් අතර දුර කොපමණ ද?

(b) (i) ඝනකයක හැඩයට නිදසුනක් ලියන්න.
(ii) ඝනකයක පතොරමක් ඇඳ දක්වන්න.
(iii) ඝනකයක දාර ගණන හා ශීර්ෂ ගණන ලියන්න.

(06) (a) කොළඹින් පෙ.ව 11.45ට පිටත් වූ දුම්රියක් ගාල්ලට ළඟාවන්නේ ප.ව 2.30ට ය. කොළඹින් පිටත්වන බස් රථයක් ගාල්ලට යාමට පැය 2 මිනිත්තු 55 ක් ගතවේ.
(i) දුම්රියෙන් කොළඹින් පිටත් වූ මගියෙකුට ගාල්ලට යාමට ගතවන කාලය කොපමණ ද?
(ii) බස් රථයක් කොළඹින් පෙ.ව 11.45ට ගාල්ලට යාමට පිටත් වේ. එහි පිටත්වන මගියෙකු ගාල්ලට යාමට හැකිවන්නේ කීයට ද?
(iii) කොළඹ සිට ගාල්ලට යාමට වැඩි කාලයක් ගතවන්නේ දුම්රියට ද? බසයට ද?

(b) අගය සොයන්න. $\frac{1}{3}+\frac{1}{6}+\frac{1}{12}$

(07) (a) පාසලක 6, 7, 8, 9 ශ්‍රේණිවල ළමා පොළක් පවත්වනු ලැබිය. මෙහි දි එක් එක් ශ්‍රේණියෙන් ලැබුණු ආදායම පහත චිත්‍ර ප්‍රස්තාරයෙන් දැක්වේ.

○ - රු. 500 ක් නිරූපණය වේ.

| ශ්‍රේණිය | ආදායම |
|---|---|
| 6 | ○ ○ ○ ○ ◕ |
| 7 | ○ ○ ○ ○ ○ ◔ |
| 8 | ○ ○ ○ ◑ |
| 9 | ○ ○ ○ ○ |

(i) වැඩිම ආදායමක් ලැබුණු ශ්‍රේණිය කුමක් ද?
(ii) අඩුම ආදායමක් ලැබුණු ශ්‍රේණිය කුමක් ද?
(iii) පොළෙන් ලැබුණු මුළු ආදායම කීය ද?

(b) (i) ඇමරිකා එක්සත් ජනපද ඩොලරයක වටිනාකම ශ්‍රී ලංකා රු.142 වන දිනයක ඇමරිකානු ඩොලර් 12ක වටිනාකම ශ්‍රී ලංකාවේ රුපියල්වලින් කීය ද?
(ii) ඉන්ධන ලීටරයකින් 40km ක් ගමන් කරන යතුරු පැදියක් 120km ක දුරක් යාමට අවශ්‍ය ඉන්ධන ලීටර ප්‍රමාණය කොපමණ ද?